www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මගහැරීම්, අර්ධ සත්‍යයන් හා මුසාවාද ජෝර්ජ් බුෂ් වෝල් වීදියට ඇපදීමේ ඉඩ ප්‍රස්ථාව ඉල්ලා සිටියි

## Evasions, half-truths and lies Bush demands passage of Wall Street bailout

**සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශය**

**2008 සැප් 25 වන දින**

වෝල් වීදිය මුදා ගැනීමේ දැවැන්ත ඇපයක් සඳහා, 23 වන දින රාත්‍රියේ සිය රූපවාහිනී කථාවෙන් ජනාධිපති ජෝර්ජ් බුෂ් කල ඉල්ලීම සමාජවාදී සමානතා පක්ෂය තරයේ ප්‍රතික්ෂේප කරයි.

විනාඩි 13 ක බුෂ්ගේ කථාව, මගහැරීමේ, අර්ධ සත්‍යයන්ගේ හා අමූලික මුසාවාදයන්ගේ සම්මිශ්‍රනයකි. එක්සත් ජනපදය "බරපතල මූල්‍ය අර්බුදයක් හමුවේ සිටින" බව ප්‍රකාශ කල බුෂ්, පිම්බූ මිල ගනන් සහිත බැංකුවල කඳු ගැසී ඇති අලෙවිකල නොහැකි වත්කම්, මිලට ගැනීම මගින් සිදුවන අලාභයේ බර මිලියන ගනනක ඇමරිකානු කම්කරු පන්තික පවුල්වල කර මත තබන හා වෝල් වීදියේ බැංකුවලට අඩුම තරමින් ඩොලර් බිලියන 700 ක් පුද කරනු ලබන නීති රෙගුලාසි සඳහා ඉක්මනින් ඉඩ සලසන ලෙස ඉල්ලා සිටිය ද, අර්බුදයේ මූලයන් පිලිබඳ පිලිගත හැකි පැහැදිලි කිරීමක් ඉදිරිපත් කලේ නැත. කම්කරු පන්තිය මුහුනපා සිටින ආර්ථික ව්‍යසනය වලක්වන ආකාරය කෙසේ වෙතත්, යෝජිත බැංකු ඇපදීම ක්‍රියාවට නගන්නේ කෙසේ ද යන්න ඔහු පැහැදිලි කලේ ද නැත.

"ගලවා ගැනීමේ ව්‍යායාමය වනාහි, ඇමරිකානු පාරිභෝගිකයන්ට හා ව්‍යාපාරවලට තම දෛනික අවශ්‍යතාවන් සඳහා නය ලැබීම හා රැකියා නිර්මානය කිරීම සහතික කිරීම" පිලිබඳව වන බවට වූ ඔහුගේ කියාපෑම පැහැදිලිව ම බොරුවකි. විශේෂයෙන්ම එක්සත් ජනපදයෙන් පිටත මූල්‍ය මාධ්‍යයන් තුල, දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව එලඹුනු අවපාතය නොවේ නම් ගැඹුරුම පසුබෑම තුලට, ඇමරිකානු හා ලෝක ආර්ථිකයේ ඇද වැටීම, ඇපදීම් මගින් වේගවත් කරනු ඇතැයි එකඟතාවක් පවතියි.

බුෂ් මෙසේ පැවසීය. "බොහෝ ඇමරිකානුවන්ට අද රාත්‍රියේ ප්‍රශ්න තිබෙන බව මම දනිමි. අප අපගේ ආර්ථිකයේ මෙමා අවස්ථාව කරා පැමිනියේ කෙසේද? මම යෝජනා කරන විසඳුම ක්‍රියාත්මක වන්නේ කෙසේ ද? ඔබගේ අනාගත මූල්‍ය තත්වය පිලිබඳව මෙහි අර්ථය කුමක් ද?"

මේවා හොඳ ප්‍රශ්නය. ඒවා පැහැදිලි පිලිතුරු ඉල්ලා සිටියි." ඔහු වැඩිදුරටත් පැවසීය.

එහෙත් බුෂ් නම් එවැනි පිලිතුරු සැපයුවේ නැත. ඒ වෙනුවට ඔහු ඉදිරිපත් කලේ, දිග හැරෙමින් ඇති විනාශය අදහාගත නොහැකි පරිදි අහසින් කඩා පාත්වුනු බලවේගයක් ලෙස පෙන්නුම් කරන විකාර කථාන්තරයකි.

"තමන්ට අලෙවි කල නොහැකි විශාල වත්කම් ප්‍රමානයකට කර ගසා සිටින බව ආයෝජන බැංකුවලට අවබෝධ විය. සිය ක්ෂනික වගකීම් බේරීම සඳහා අවශ්‍ය මුදල් හිඟවීම හමුවේ ඔවුන් මුහුන පෑවේ අනිවාර්ය කඩා වැටීමකටය. අනෙකුත් බැංකු තමන් බරපතල මූල්‍ය ගැටලුවලට මුහුනපා සිටින බව දැනගත්තේය. මෙම බැංකු සිය මුදල් රඳවා ගැනීමට පටන් ගත් අතර, නයදීම් වියලී ගියේය. ඇමරිකානු මූල්‍ය පද්ධතියේ ගියරයන් ක්‍රියා විරහිතවී නතරවීමට පටන් ගත්තේය."

එහෙත් මේ සියලු වල් පල් හා ඔහුගේ ම අරමුනු මධ්‍යයේ බුෂ්ගේ කථාව, එක්සත් ජනපදයේ සමාජ, ආර්ථික හා දේශපාලන පද්ධතිය පිලිබඳ පෙර නොවූ විරූ හා විනාශකාරී හෙලිදරව්වක් හා චෝදනාවකට සමාන ය. ජාතික හා ජාත්‍යන්තර ප්‍රේක්ෂකත්වයක් හමුවේ ලෝකයේ විශාලතම ධනේශ්වර ආර්ථිකය බිඳ වැටීමේ අද්දරට ම පැමින ඇති බව ඔහු පිලිගත්තේ ය.

"විශ්වාසය කඩවීම පුලුල් ලෙස පැතිර තිබේ. ඇමරිකානු මූල්‍ය ක්‍රමයේ ප්‍රධාන අංශ වසා දැමීමේ අනතුරට මහුනපා ඇතැයි" ද, කොන්ග්‍රසය, ඇප දීමේ යෝජනාවලියට සහාය පල නොකල හොත් "ඇමරිකාව මූල්‍ය අලා මුලාවකට ඇද වැටී අයහපත් වාතාවරනයක් එලඹෙනු ඇතැයි" ද ඔහු පැවසීය. "ඔබ අහල පහල ඇති බැංකු ද ඇතුලු තව තවත් බැංකු අසාර්ථක වනු ඇත. ඔබගේ විශ්‍රාමික පාරිතෝෂිකයේ වටිනාකම පහල දමමින් කොටස් වෙලඳපොල තව දුරටත් වැටෙනු ඇත. ඔබගේ නිවසෙහි අගය හැකිලී යා හැකිය. නිවාස අහිමිවීම් නාටකාකාර ලෙස වැඩිවනු ඇත.

"ඔබට ව්‍යාපාරයක් හෝ ගොවිපලක් ඇත්නම් නය ලබාගැනීම වඩ වඩාත් දුෂ්කර හා වියදම් අධික වනු ඔබට දැකගත හැකි වෙයි. බොහෝ ව්‍යාපාර සිය දොරවල් වසා දමනු ද මිලියන ගනනක් ඇමරිකානුවන්ට රැකියා නැතිවනු ද දැකිය හැකි වෙයි.

"නය ගනුදෙනු පිලිබඳව ඔබට හොඳ වාර්තාවක් තිබුනත් ඔබගේ දරුවන් පාසැල් යැවීමට හෝ මෝටර් රථයක් මිලට ගැනීම සඳහා අවශ්‍ය නයක් ලබා ගැනීම වඩාත් දුෂ්කර වනු ඇත. අවසාන වශයෙන් අපගේ රට දිගු හා වේදනාකාරී අවසානයක් හමුවේ පීඩාවට පත් වනු ඇත."

මේ මංමුලා සහගත තත්වය වැඩී වර්ධනය වූයේ කෙසේද යන්න සම්බන්ධයෙන් බුෂ්, දුර්වල තීන්දු, නම් නොකල පුද්ගලයන් කිහිප දෙනෙකුගේ වගකීම් විරහිත ක්‍රියා හා වෝල් වීදියේ අතිරික්තයන් පිලිබඳව වටින් ගොඩින් හේතු දක්වමින් නිවාස අර්බුදය ගැන ද එහෙන් මෙහෙන් කථා කලේය. එහෙත් ඩොලර් බිලියන 700 කට වැඩි බදු ගෙවන්නන්ගේ මුදල් බැංකු හා ආයෝජන ආයතන අතට පත් කිරීමෙන් අර්බුදය විසඳන්නේ කෙසේදැයි පැහැදිලි කිරීමට ඔහු අසමත් විය.

සැබවින්ම ඔහුගේ ඇප දීමේ සැලැස්ම වනාහි, එක්සත් ජනපදයේ හා සමස්ත ලෝකයේ ම කම්කරු පන්තිය මතට එහි බර පටවන අතර, ඇමරිකානු පාලක පන්තියේ අතිශය බලගතු කොටස්, තමන්ම නිර්මානය කල අර්බුදය ගසා කමින් තව තවත් තර වීමට දරන නග්න උත්සාහයකි.

"ලෝකය මෙතෙක් තනාගෙන ඇති හොඳම ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදී ධනවාදය" බව සියල්ලන්ට සහතික වෙමින් බුෂ් කථාව අවසන් කලේය. යථාර්තයේදී ධනවාදය, ජන සමූහයන්ගේ සමාජ අවශ්‍යතා, ආර්ථික පරපුට්ටන්ගේ අනුකම්පාව මත තබන, දූෂනයෙන් ඇලලී ගිය, ආවේනිකව ම අස්ථාවර පද්ධතියක් ලෙස හෙලිදරව් කෙරී ඇත.

සමහර විට බුෂ්ගේ කථාවෙහි ලොකු ම ව්‍යාජය, " වෙලඳපොල නියමාකාරයෙන් ක්‍රියාත්මක නොවන" නිසා වෝල් වීදියට කප්පම් ගෙවීමේ අවශ්‍යතාවය පිලිබඳ ඔහුගේ අවධාරනය විය හැකිය. යථාර්ථය නම්, ලාභ පද්ධතිය තුලම මුල්බැස තිබෙන ආර්ථික තීරන ගැනීමේ අයථා භාවය හා සාපරාධිත්වය, ධනවාදයේ නීතිවලට අනුකූලව ම ක්‍රියාත්මක වීමයි.

බුෂ් යෝජනා කල ඇප දීමේ සැලැස්ම සම්බන්ධයෙන් ගත් විට, එය සකස්කර ඇත්තේ එක් මූලික අරමුනක් සහිතවය. එනම්, සුපිරි ලාභ හා යෝධ පුද්ගල ධන රාශීකරනය මුල් කොට ගෙන නිර්මානය කල නය කන්ද කඩාවැටීමේ ප්‍රතිපල වශයෙන්, මූල්‍ය ප්‍රභූවට අත්වන පාඩුවලින් ඔවුන් රැක ගැනීමයි.

මේ සතියේ පැවැත්වූ කරුනු විමසීමේ කොන්ග්‍රස් සැසිය තුල භාන්ඩාගාර ලේකම් හෙන්රි පෝල්සන් හා ෆෙඩරල් මහ බැංකු සභාපති බෙන් බර්නන්කේ, සිය නිවාස හා දිවි පැවැත්ම අහිමිවීමට මුහුනපා සිටින මිලියන ගනන් කම්කරුවන් ඔවුන්ගේ ඉරනමට අතහැර දමන අතර, බැංකුවලට ඉමහත් වාසි සැලසීමට වඩා කිසිවක් ඔවුන්ගේ ඇප දීමේ සැලැස්මෙන් ඉදිරිපත් නොවන්නේ මන්ද යන්න පිලිබඳ මොනම තර්කාන්විත පැහැදිලි කිරීමක් හෝ ගෙන ඒමට අසමත් විය.

ඇප දීමේ සැලැස්මෙහි නග්න පන්ති ස්වභාවය, විධායක වැටුප් මත ඉතා සුලු හෝ සීමාවන් හා මහජන භාන්ඩාගාරය කොල්ල කෑමට හිලව් වශයෙන්, ඔවුන් සතු ව්‍යාපාර වස්තුවලින් කොටසක් දිය යුතු බවට ඉදිරිපත්ව ඇති යෝජනා පිලිබඳව පවා, බැංකුවලින් එල්ල වන කටුක විරුද්ධත්වය මඟින් පැහැදිලි කෙරෙයි.

බුෂ්ගේ කථාවත් සමඟ ඇපදීමේ සැලැස්ම අනුමත කිරීමට කොන්ග්‍රසය ගත යුතු කඩිනම් පියවර පිලිබඳව කෙරෙන බලපෑම් උත්සන්න වෙමින් තිබේ. සතිය පුරා ම කෙරුනු සාකච්ඡාවල දී මන්ත්‍රී මන්ඩලයේ හා සෙනේට් සභාවේ ඩිමොක්‍රටික් පක්ෂ නායකයන් ඇපදීමේ මූලික ආකෘතිය පිලිගෙන තිබේ. සැලැස්මේ විවිධ අංශ කෙරෙහි පලවූ ඔවුන්ගේ දෙගිඩියා සහගත හා අර්ධ නාටකාකාර විරෝධතා, ඇපදීම කෙරෙහි පලව ඇති දැවැන්ත විරුද්ධත්වයට කුහක ලෙස අනුගත වීමකට වඩා තරමක් වැඩි දෙයකි.

සෙනේට් බැංකු කමිටුවේ සභාපති සෙනේට් සභික ක්‍රිස්ටෝෆර් ඩොඩ්, 24 වන දින ඔහුගේ ප්‍රකාශයන් තුල, ඩිමොක්‍රටිකයන්ගේ මන්තරයක් බවට පත්ව ඇති, අර්බුදයට මුල්වූ හේතු සාධක ගැන කථාව නතර කර ''ඉදිරිය ගැන සිතීමේ'' අවශ්‍යතාවය පිලිබඳ කථාව ම යලි වැමෑරීය. එක්සත් ජනපද හා ලෝක ආර්ථික පද්ධතියේ බිඳ වැටීමට මුල්වූ හේතු සලකා බැලීමකින් තොරව විසඳුමක් සොයාගත හැකිවා සේය.

ඇප දීමට සිය පූර්න සහයෝගය ලබාදුන් ඩිමොක්‍රටික් ජනාධිපති අපේක්ෂක බරක් ඔබාමා සිය පරිපාලනයක් තුල පෝල්සන් භාන්ඩාගාර ලේකම් වශයෙන් තවදුරටත් තබා ගැනීමේ හැකියාව ගැන කීම දක්වා දුරට ගියේය. මූල්‍ය ප්‍රාග්ධනයේ අවශ්‍යතාවන් රුදුරු ලෙස ආරක්ෂා කරන බව මූල්‍ය ප්‍රභූත්වයට හා මාධ්‍යවලට සහතික වීම මඟින් ධවල මන්දිරයට මඟ පාදා ගැනීමට බලාපොරොත්තු වන දක්ෂිනාංශික දේශපාලඥයෙක් ලෙස හෙලිදරව්වී ඇති ඔහුගේ " වෙනස" හා "නව දේශපාලනය" ක් පිලිබඳ වාචාල කථා ප්‍රදර්ශන සැරසිල්ලක් පමනි.

මෙම සිදුවීම් මඟින්, ධනේශ්වර පද්ධතියේ හා ඇමරිකානු සමාජයෙහි ආධිපත්‍ය දරන මූලික පන්ති බෙදීම්, යන දෙ අංශයම හෙලිදරව් කෙරී ඇත. මෙයින්

එලි මහනට පැමින ඇත්තේ ද්වි පක්ෂ ක්‍රමය මූල්‍ය ප්‍රභූ පැලැන්තියේ උපකරනයකට වැඩි කිසිවක් නොවන බවය. ප්‍රජාතන්ත්‍රවාදී වහන්තරාවට පිටුපසින් ඇත්තේ ධනපතියන්ගේ ඒකාධිපති පාලනයයි.

වැදගත්ම ප්‍රශ්නය වන්නේ අර්බුදය සඳහා ගෙවන්නේ කවුරුන්ද යන්නයි.

සමාජවාදී සමානතා පක්ෂය, මූල්‍ය ව්‍යසනය සමඟ පොර බැදීම සඳහා බුෂ් පරිපාලනය මෙන්ම ඩිමොක්‍රටික් පක්ෂය ද යෝජනා කර ඇති සමස්ත ආකෘතියම ප්‍රතික්ෂේප කරයි. කෙසේ වුව ද, සුලු ප්‍රශ්න අරභයා ඔවුන් වචන හරඹ කර ගත්ත ද, ජනගහනයේ අති මහත් බහුතරය වන කම්කරු පන්තිය අර්බුදයේ බර දැරිය යුතුය යන්න ගැන ඔවුන් සියල්ලන්ම එකඟය.

සසප ආස්ථානය වන්නේ, එක්සත් ජනපද දේශපාලන ව්‍යුහය හා ආර්ථික පද්ධතිය යන දෙකෙහිම, හදිසි හා මූලික වෙනසක අවශ්‍යතාවය මෙම අර්බුදයෙන් එලිමහනට ගෙනැවිත් ඇති බවයි. ධනේශ්වර පන්තියේ පක්ෂ දෙක වන රිපබ්ලිකන් හා ඩිමොක්‍රටික් යන පක්ෂ දෙක හරහා එක්සත් ජනපදය පාලනය කරන ඒකාධිපතිත්වයට විරුද්ධව ස්වාධීන දේශපාලන බලවේගයක් ලෙස කම්කරු පන්තිය බලමුලු ගැන්විය යුතුය.

මේ පදනම මත පක්ෂය ධනවාදයේ විනාශයට, සමාජවාදී විසඳුමක් ඉදිරිපත් කරයි.

සමාජවාදී සමානතා පක්ෂය, හිමිකරුවන්ට වන්දි ගෙවීමකින් තොරව බැංකු හා මහා මූල්‍ය ආයතන ජනසතු කිරීම හා වැඩ කරන ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යටතේ ඒවා පොදු ව්‍යවසායන් බවට පරිවර්තනය කිරීම සඳහා කැඳවුම් කරයි. සමාජයේ වැදගත්ම මූල්‍ය ලීවරයන් පුද්ගලික අයිතියෙන් විමුක්ත විය යුතු අතර ඒවා ජනතාවගේ අවශ්‍යතා සඳහා නිෂ්පාදන බලවේග බෙදාහැරීම හා පුලුල් කිරීමට යොදාගත යුතුය. සමපේක්ෂකයන්ගේ හා බැංකු කරුවන්ගේ පුද්ගලික ගිනුම්වලට හරවා යැවෙන ඩොලර් බිලියන ගනන්වූ සමාජ ධනය ජනතාවට සහන සැලසෙන ක්‍රියාවලීන් පුලුල් කිරීම සඳහා යලි අත් පත් කර ගත යුතුය. අර්බුදය ගිනි ඇවිලවූ වංචාව හා දූෂනය පිලිබඳව, මහජනතාවට වාර්තාවක් ඉදිරිපත් කල යුතු අතර

වගකිව යුත්තන් සාපරාධී චෝදනා ද ඇතුලු මාධ්‍යයන් මඟින් වගකීමට යටත් කල යුතුය.

ප්‍රධාන බැංකු, මූල්‍යායතන, රක්ෂන සමාගම් හා ආරක්ෂන අරමුදල් වල ගිනුම්, මහජනතාවගේ පරීක්ෂාවට විවෘත කල යුතු අතර නීති විරෝධී හා සමාජයීය වශයෙන් විනාශකාරී වැඩ කටයුතු හෙලිදරව් කල යුතුය.

සමාජවාදී සමානතා පක්ෂය, කම්කරු පන්තිය සඳහා කම්කරු පන්තිය විසින් ගොඩනඟන කම්කරු ආන්ඩුවක් නිර්මානය කිරීමට පෙරමුන ගනියි. එමඟින්, නිවාස අත් පත් කර ගැනීම් හා වෙන්දේසි කිරීම් නතර කිරීම, ප්‍රසිද්ධ රැකියා අවස්ථාවන් මිලියන ගනනක් නිර්මානය කිරීම, වැටුප් කප්පාදුව හා දොට්ට දැමීම් තහනම් කිරීම හා මහජන සේවාවන් විශාල පරිමාවකින් ප්‍රසාරනය කිරීම ද ඇතුලු වැඩකරන ජනතාවගේ අවශ්‍යතාවන් වෙනුවෙන්, අර්බුදය විසඳීමේ හදිසි පියවර ගනු ඇත.

මෙම ක්‍රියාමාර්ගය 2008 මැතිවරනය තුල සමාජවාදී සමානතා පක්ෂයේ ජනාධිපති හා උප ජනාධිපති අපේක්ෂකයන් වන ජෙරොම් වයිට් හා බිල් වැන් ඕකන් විසින් ඉදිරිපත් කරනු ලබයි.

සමාජවාදී විකල්පයක් සඳහා අවශ්‍යතාවය දැක ගන්නා සියලු දෙනාට මෙම ව්‍යාපාරයට සහාය දෙන ලෙසත් සමාජවාදී සමානතා පක්ෂයට බැඳෙන ලෙසත් අපි ඉල්ලා සිටිමු.